කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2012

2015 පෙබරවාරි

**BCOME 2063** - විගණනය

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

01.

i. "සහතික කල ගිවිසුමක් " සහ " සහතික නොකල ගිවිසුමක්" යන පද අතර වෙනස දක්වන්න.

(ලකුණු 05)

ii. සහතික කල ගිවිසුම් වල අවදානම යන්නෙන් කුමක් අදහස් වේද ?

(ලකුණු 05)

iii. මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී ගිවිසුම් හවුල්කරු (engagement partner) ලෙස ඔබ විසින් පිළිපැදිය යුතු අවශ්‍යතාවයන් කවරේද ?

(ලකුණු 05)

iv. විගණනයක් සිදුකිරීම සහ ඒ මත නිරවද්‍ය මතයක් ප්‍රකාශ කිරීමට විගණකවරයෙකු වශයෙන් ඔබට අවශ්‍ය තරම් කාලයක් ලබාගත හැකි බව ඔබගේ මිතුරෙකු යෝජනා කරන ලදී. ඔබ එකඟවන්නේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. අ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කරන ලද වෘත්තිමය ගණකාධිකාරිවරුන් සඳහාවූ ආචාරධර්ම සංග්‍රහයට අනුව විගණකවරයෙකුගේ වෘත්තිමය වගකීම පාලනය කරනු ලබන ආචාරධර්ම කෙටියෙන් පහදන්න.

(ලකුණු 10)

ආ. ආයතනයක තොග අගය සංනිරීක්ෂණය සඳහා සුදුසු විගණන ක්‍රියාමාර්ගයන් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. දසුන් සීමිත පොදු සමාගමේ 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය සම්බන්ධව ගිවිසුම් තත්ත්ව පාලන සමාලෝචක ලෙස ඔබව පත්කරන ලදී.

අ. ගිවිසුම් තත්ත්ව පාලන සමාලෝචක යනු කවරෙක් ද ?

(ලකුණු 04)

ආ. ගිවිසුම් කණ්ඩායම් මගින් අරමුණු ඇගයීම සිදුකිරීමේ දී සිදු කරන ලද විශේෂිත විනිශ්චයන් සහ විගණකගේ වාර්තාව සැකසීමේ දී ලඟා වී ඇති නිගමනයන් ඇගයීමේ දී ඔබට ගිවිසුම් තත්ත්ව පාලන සමාලෝචකයෙකු ලෙස කවර ආකාරයේ තොරතුරු ඇගයීමට සිදුවේ ද ?

(ලකුණු 08)

ඇ. සමාලෝචනය කරන ලද විගණක ගිවිසුම සම්බන්ධව ගිවිසුම් තත්ත්ව පාලන සමාලෝචක ලෙස ඔබ විසින් ලේඛන ගත කල යුතු කරුණු කවරේද ?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. ආයතනය සතුව පවතින වත්කම් අයතා ලෙස පරිහරණය කළ හැකි (misappropriation) විවිධ ක්‍රමවේද මොනවා ද ?

(ලකුණු 04)

ආ. ඔබ මේ වන විට විගණක කළමණාකරුවකු වශයෙන් විගණන ආයතනයක සේවය කරයි. ඔබගේ සේවාදායක ආයතනයක ඉහළ කළමණාකරනය විසින් බැංකු ණයක් ලබාගැනීමේ අරමුණින් මූල්‍ය ප්‍රකාශන විකෘති කිරීම (manipulation) සඳහා ආයතනයේ ගණකාධිකාරිවරයාට බලපෑම් කරන බවට ඔබ දැනගන්නා ලදී.
ඔබ විසින් මෙම ආයතනය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී මෙවන් අවදානම් සඳහා ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද ?

(ලකුණු 08)

ඇ. වංචාවන් හඳුනා ගැනිම හා නැවැත්වීම (Prevention and detection of fraud) සම්බන්ධයෙන් විගණක සහ කළමනාකරණය සතුව පවතින වගකීම් කවරේ ද ?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

05. පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

අ. කාර්ය ඵල ප්‍රමාණාත්මකභාවය (Performance materiality)

ආ. ආවේනික අවදානම (Inherent risk )

ඇ. ලේඛණ ගතකිරිම( Documentation)

ඉ. මූල්‍ය ප්‍රකාශනයන්ට අදාලව අනුකූලතා නොවීම (Non compliance)

(මුළු ලකුණු 5x4 =20)